ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## ඉන්දියාවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ කෝමාරි ගම්මානයට RO ජල පිරිපහදුකරණ ඒකකයක් සහ බස් නැවතුම්පොළක්

2025 ඔක්තෝබර් 28 වන දින ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් ප්‍රාදේශීය සභාවට අයත් කෝමාරි ගම්මානයේ RO ජල පිරිපහදුකරණ ඒකකයක් සහ බස් නැවතුම්පොළක් විවෘත කළේය. ඉන්දීය රජය විසින් පරිත්‍යාග කරන ලද ජල පිරිපහදුකරණ ඒකකය ගම්මානයේ සහ ඒ අවට 1000ක පමණ ජනතාවකට සෙත සලසනු ඇත. ඉන්දියානු රජයේ පරිත්‍යාගයක් වන බස් නැවතුම්පොළ ද ගම්වැසියන්ට මහත් පහසුවක් සලසනු ඇත.

2. පාර්ලිමේන්තු මන්ත්‍රී අබ්දුල් වසිත්; පොතුවිල් ප්‍රාදේශීය ලේකම් අහමඩ් නසීල්; පොතුවිල් ප්‍රාදේශීය සභාවේ උප සභාපතිතුමා ඇතුළු අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

3. ඉන්දියානු මහ කොමසාරිස්තුමා 2025 ඔක්තෝබර් 28-30 දිනවල නැගෙනහිර පළාතේ නිල සංචාරයක නිරත වේ. මෙය පළාත සමඟ සම්බන්ධතා අඛණ්ඩව ව්‍යාප්ත කිරීම සඳහා ඉන්දියාව ගන්නා ප්‍රයත්නයේ කොටසකි. මෙම සංචාරය අතරතුරදී, මහ කොමසාරිස්තුමා කල්මුණයෙ නගරයේ පාසල් සඳහා සහයෝගය ලබා දීමට සහ ආර්ථික වශයෙන් පසුගාමී පවුල්වල දක්ෂ දරුවන් සඳහා ඉන්දීය ප්‍රදාන යටතේ විශේෂ මූල්‍යාධාර වැඩසටහනක් දියත් කිරීමට නියමිතය. තවද, ඉන්දීය ප්‍රදාන යටතේ අම්පාරේ ඉදිකරන ලද මහත්මා ගාන්ධි ආදර්ශ ගම්මානය මහ කොමසාරිස්තුමා සහ නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය වෛද්‍ය සුසිල් රණසිංහ මහතා විසින් විවෘත කිරීමට නියමිතය.

*****

**කොළඹ**
***2025* ඔක්තෝබර් *29***